# ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්වය ඉහළ නැංවීමේ වැදගත්කම

එම්.ඩබ්.ඒ.එස්.එම්. වීරසිංහ[1]      කේ.බී.ආර්. සෙනවිරත්න[2]
ජී.එච්.ඒ.එල්. සඳරුවන්[3]

## සංක්ෂේපය

සමස්ත ශ්‍රමබලකා සහභාගිත්ව අනුපාතය සඳහා ප්‍රධාන වශයෙන් ම අඩු ස්ත්‍රී ශ්‍රමබලකා සහභාගීත්වය හේතු වී ඇත. වර්තමානයේ දි ශ්‍රී ලංකාවේ පුරුෂ ශ්‍රමබලකා සහභාගීත්ව අනුපාතිකය 75% ක් පමණ වන අතර ස්ත්‍රී ශ්‍රමබලකා සහභාගීත්ව අනුපාතිකය 35% ක් පමණ වේ. කලාපයේ අනෙකුත් රටවල් සමග ගත්විට ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ශ්‍රමබලකා සහභාගීත්වය සැලකිය යුතු අඩු මට්ටමක පවති. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ශ්‍රමබලකා සහභාගිත්වය ඉහළ නැංවීමේ වැදගත්කම පිළිබඳව අධ්‍යයනය කිරීමයි. ඒ සඳහා ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්වය පහළ මට්ටමේ පවතින්නේ ඇයි ද යන්න අධ්‍යයන ගැටළුව ලෙස සලකා ඇත. පර්යේෂණය සඳහා 2005-2014 කාල පරිච්ඡේදය තුළ සේවා වියුක්ති අනුපාතිකයට සහ ශ්‍රමබලකා සහභාගීත්ව අනුපාතිකයට අදාල ද්විතීයික දත්ත මහාබැංකු වාර්තාව මඟින් ලබාගත් අතර අවුරුදු 10ක කාලය තුළ ස්ත්‍රී ශ්‍රමබලකා සහභාගිත්වය හා සේවා වියුක්ත අනුපාතිකයේ හැසිරීම පරික්ෂා කිරීම සඳහා ප්‍රවණතා විශ්ලේෂණයක් සිදුකරන ලදි. එහි දී 2005ට සාපේක්ෂව 2014 වසරේ සේවා වියුක්ති අනුපාතිකය 5%කින් පමණ අඩු වී ඇති අතර ශ්‍රමබලකා සහභාගීත්ව අනුපාතිකය 3% කින් පමණ වැඩි වී ඇත. නමුත් මෙම වර්ෂ දෙක තුළ සැලකිය යුතු මට්ටටේ විශාල වෙනසක් සිදු වී නොමැත. එනම් පුරුෂ සේවා වියුක්ති අනුපාතිකය සහ ශ්‍රමබලකා සහභාගීත්ව අනුපාතිකය සමග සැලකූ විට ස්ත්‍රී දායකත්වය ඉතා පහළ මට්ටමක පවතින බැව් තහවුරු විය. ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ශ්‍රමබලකා සහභාගිත්වය පහළ මට්ටමක පැවතීමට හේතු කිහිපයක් පවතී. එනම් බහුතරයක් ස්ත්‍රීන් අධ්‍යාපන කටයුතුවල නියැලීම, ගෘහස්ථ වගකීම්වල නියැලීම, දරුවන් රැකබලා ගැනීම, ආරක්ෂාකාරී නේවාසික පහසුකම් සහ රාජකාරී ස්ථානයට යෑමට ඒමට ප්‍රවාහන පහසුකම් නොමැතිවීම, තාවකාලික ව සේවයෙන් ඉවත් වූ පසු නැවත රැකියාවක් සොයාගත නොහැකි වීම සහ ශ්‍රම සංචලනය සැලකූ විට වැඩි රැකියා අවස්ථා සපයන ප්‍රදේශ කරා යාමට පුරුෂයින්ට වඩා කාන්තාවන්ට අපහසු වීම දැක්විය හැකිය. තිරසාර ආර්ථිකයක් පවත්වාගැනීමට පමණක් නොව කාන්තාව සවිබල ගන්වමින් ආර්ථික වර්ධනය සඳහා ඔවුන්ගේ

---

[1]ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණියවිශ්වවිද්‍යාලය
mwasmgamindaweerasinghe@gmail.com
[2] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
anjalisenavirathne@gmail.com
[3] කළමනාකරණවේදී (විශේෂ) දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, 1992alsandaruwan@gmail.com

සහභාගීත්වය සහතික කරගැනීමට, ජනතාව වයස්ගතවීමේ අභියෝග ජයගැනීමට, ගැහැණු දරුවන්ගේ අධ්‍යාපනය සඳහා දරන ජාතික ආයෝජනයෙහි ප්‍රතිලාභ සාක්ෂාත් කරගැනීමට මෙන් ම නැගී එන කර්මාන්තවල ශ්‍රම ඉල්ලුම සපයාදීමට කාන්තා ශ්‍රමය වැඩි වශයෙන් ආකර්ෂණය කරගැනිම වැදගත් බැව් නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද :** *ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ශ්‍රමබලකා සහභාගිත්වය, සේවා වියුක්ති අනුපාතිකය*